සැ. යු. — 2014.10.03 වැනි දින පළ වූ අංක 1,883 දරන ගැසට් පත්‍රයේ I:III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,884 - 2014 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා - 2014.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1192 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1204 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1205 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1207 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

ගිරිබාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර ලේකම්, ගිරිබාව ප්‍රාදේශීය සභාව, තඹුත්ත යන ලිපිනයට 2014.10.20 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | ජී. එල්. 1- 2006 ඒ- රු.11,730 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 02. | පුස්තකාල උපස්ථායක ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | ජී. එල්. 1-2006 ඒ - රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 02 | ජී. එල්. 1-2006ඒ- රු. 11,730 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 04. | සෞඛ්‍ය කම්කරු ප්‍රාථමික - ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | ජී. එල්. 1- 2006ඒ - රු. 11,730 10 x 120 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

03. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :-*

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
* වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
* තෝරා ගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

04. *වෙනත් පොදු කොන්දේසි :-*

* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03 කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

* දැනටමත් ගිරිබාව ප්‍රාදේශීය සභාවේ, ස්ථිර අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු වූවත් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තා වූද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබා ගත්තා වූද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරා ගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.

* මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, වයඹ පළාත් සභාව හෝ ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *අයදුම් කලයුතු ආකාරය* :

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2014.10.20 දින හෝ එදිනට පෙර ලැබෙනසේ "ලේකම්, ගිරිබාව ප්‍රාදේශීය සභාව, තඹුත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුපත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත ඒ -4 ප්‍රමාණයේ කඩදාසි වල ඉදිරිපත් කළ යුතුය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

* උප්පැන්න සහතිකය,
* අධ්‍යාපන සහතික,
* පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය,
* මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය),
* වෘත්තීය පළපුරුදු පිළිබඳ සහතික
* සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි).

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ, ඉංග්‍රීසි පරිවර්තන වල අර්ථ ගැටීමක් ඇතිවුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ඩී. ඒ. දිසානායක,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 16 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**අයදුම්පත්‍රය**

***ගිරිබාව ප්‍රාදේශීය සභාව***

..................................... තනතුර සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :——————————————
මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————————

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————————
03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය:——————————————
04. ස්ථිර ලිපිනය :——————————————
05. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————
06. උපන් දිනය:——————————————

07. —————— දිනට වයස:
අවුරුදු:———— මාස :———— දින :————
08. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————
09. විවාහක/අවිවාහක බව :————————————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? :————————————————
11. අධ්‍යාපන සුදුසුකම් :————————————————
(සමත් වූ විවාහ පිළිබඳ විස්තර)
12. වෘත්තීමය සුදුසුකම් හා පළපුරුද්ද:————————————————

13. ඔබ දැනටමත් මෙම ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර:————————————————
එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම් ද යන වග)

14. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගත හොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.................................................. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ———————————— වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————————————————
පදවි නාමය :————————————————
දෙපාර්තමේන්තු/ආයතන (නිල මුද්‍රාව යොදන්න)
දිනය :————————————————

10-311

---

**තවලම ප්‍රාදේශීය සභාව**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

තවලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| | *තනතුර* | *සේවා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 1 | විදුලි කාර්මික | "ප්‍රාථමික අර්ධ ශිල්පීය" | 01 | රු. 12,210 -130 x 10 - 145 x 10 -160 x 10 - 170 x 12 - 18,600 (රා. ප. ච. අංක 06/2006 - (iv) PL2-2006 -A ) | අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුය.<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබිය යුතුය.<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

| | තනතුර | සේවා ගණය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පලපුරුද්ද |
|---|---|---|---|---|---|
| 2 | කාර්යාල කාර්ය සහායක | "ප්‍රාථමික ශිල්පීය නොවන" | 01 | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12- රු. 17,600 (රා.ප.ච. අංක 06/2006 -(iv) PL1-2006-A) | අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුය. |
| 3 | .වැඩ/ක්ෂේත්‍ර කම්කරු | "ප්‍රාථමික ශිල්පීය නොවන" | 06 | රු. 11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 - රු. 17,600 (රා.ප.ච. අංක 06/2006-(iv) PL1-2006 -A | යටත් පිරිසෙයින් 08 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. |
| 4 | සෞඛ්‍ය කම්කරු | "ප්‍රාථමික ශිල්පීය නොවන | 05 | රු.11,730 -120 x10 - 130 x10- 145 x 10 - 160 x 12 - රු. 17,600 (රා.ප.ච. අංක 06/2006 - (iv) PL1-2006-A) | යටත් පිරිසෙයින් 08 වැනි ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට/උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාද්ශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(v) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
(vii) තවලම ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(viii) තණකොළ කපන යන්ත්‍රය භාවිතය, වඩු හා පෙදරේරු වෘත්තිය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඇති අය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ix) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම තවලම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සතුය.

03. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි .-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් අරමුදල් යටතේ දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද/රජයේ මුදල් රෙගුලාසි වලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද/දකුණු පළාත් සභාව හෝ තවලම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය .-*

(i) සම්මුඛ පරීකෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
(iii) සම්මුඛ පරීක්ෂණයෙන් ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

05. *ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන .-*

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී එම ලියකියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
(iv) මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක්,
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
(vi) පළපුරුදු පිළිබඳ සහතික,
(vii) තවලම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

06. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ දැක්වෙන ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත සකස් කර 2014 නොවැම්බර් මස 03 දිනට පෙර "සභාපති, තවලම ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 16 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*තවලම ප්‍රාදේශීය සභාව*

දකුණු පළාත් රාජ්‍ය සේවයේ —————— තනතුර සඳහා බඳවා ගැනීම

1. මුලකුරු සමග නම :————————————————
   (i) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————————
2. ස්ථිර පදිංචි ලිපිනය :————————————————
3. (i) උපන් දිනය : අවුරුද්ද:—————— මාසය:—————— දිනය :——————
   (ii) අයදුම්පත භාරගන්නා අවසාන දිනට වයස: අවුරුදු :—————— මාස :—————— දින :——————
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————
6. විවාහක/අවිවාහක බව :——————
7. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? :——————
8. ජාතිය :——————
9. අධ්‍යාපන සුදුසුකම් :

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

10. වෘත්තීය සුදුසුකම්/සේවා පළපුරුද්ද:——————
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?:——————.
12. ඔබ දැනටමත් තවලම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:
    (i) දැනට දරන තනතුර:——————.
    (ii) එම තනතුරට පත් වූ දිනය:——————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත) :——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වන බවද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ ———————— තනතුර දරන ................................ මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

---

10-312

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.08.22 වැනි දින පළ කරන ලද ගැසට් නිවේදනයේ IV(ආ) කොටසේ සඳහන් කළ තනතුරු වල අධ්‍යාපන සුදුසුකම්වල ගැටලුවක් මතු වී ඇති හෙයින් එම ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරමි.

නැවත සංශෝධිත ගැසට් නිවේදනයක් පළ කිරීමට ඉදිරියට කටයුතු කරන බවට වැඩි දුරටත් දන්වමි.

ඕ. පී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 16 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී.

10-345

---

**කටුනායක - සීදුව නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කටුනායක - සීදුව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර "ලේකම්, කටුනායක - සීදුව නගර සභාව, සීදුව" යන ලිපිනයනට 2014.11.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| 3. *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු IIආ | 02 | රු. 12,740 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860/ | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් සම්මාන සමාර්ථ දෙකක් සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම (එක් වරකදී අවම වශයෙන් විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය.)<br>*හා*<br>කුලී රථ හා තාර බාර හොන්ඩර 24ට අඩු ස්ටේෂන වැගල් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. |
| කාර්යාල සේවක සේවය III (සෞඛ්‍ය කම්කරු) | 05 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600/- | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| කාර්යාල සේවක සේවය III වැඩ කෂේත්‍ර කම්කරු (මාර්ග කම්කරු) | 03 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600/- | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය / 6 වන වසර සමත්විය යුතුය. |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| කාර්යාල සේවක සේවය III වැඩ කෂේත්‍ර කම්කරු (විදුලි කම්කරු) | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600/- | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය / 9 වන වසර සමත්විය යුතුය. |
| කාර්යාල සේවක සේවය III වැඩ කෂේත්‍ර කම්කරු (පුස්තකාල කම්කරු) | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600/- | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය / 9 වන වසර සමත්විය යුතුය. |

4. *වයස් සීමාව* .– ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.

5. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය ;
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය ;
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය ;
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය ;
(v) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ ;
(ii) රියදුරු තනතුර සඳහා සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු මත බඳවා ගැනේ.

7. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;

(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;

(iii) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු, ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ. ;

(iv) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

8. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය :

(i) උප්පැන්න සහතිකය ;
(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
(iii) අධ්‍යාපන සහතික.

බී. ඒ. පී. එල්. ජෙනට්,
ලේකම් *(වැ.බ.)*,
කටුනායක - සීදුව නගර සභාව

2014 සැප්තැම්බර් මස 23 වැනි දින.

**කටුනායක - සීදූව නගර සභාව**

*.......................................... තනතුර සඳහා ඉල්ලුම් කිරීම*

1. (අ) මුලකුරු සමග නම :——————————————
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————
2. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
3. (අ) ස්ථිර පදිංචි ලිපිනය :——————————————
   දුරකථන අංකය :——————————————
   (ආ) කාර්යාලීය ලිපිනය :——————————————
   දුරකථන අංකය :——————————————
4. (අ) උපන් දිනය :——————————————
   (ආ) 2014.11.10 දිනට වයස :
   අවුරුදු :................................ මාස : ................................ දින : ........................................
5. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————
6. විවාහක/අවිවාහක බව :——————————————
7. ස්ත්‍රී/පුරුෂභාවය :——————————————
8. අධ්‍යාපන සුදුසුකම් :——————————————
9. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————————
10. ඔබ මීට පෙර රජය යටතේ සේවයකර තිබේද, එසේ නම් විස්තර :——————————

මවිසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————————

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන**

මෙම ආයතනයේ ........................................ තනතුර දරන .............................................මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම/හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැතිබවත්, ඒ පිළිබඳ කටයුතු සකස් කිරීමට අදහස්කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ——————————

10 - 480

## මහරගම නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුර හා වැටුප් පරිමාණය :*

1. විදුලි කාර්මික III

තනතුරු - 01

මාසික : රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL-2-2006A)

(I) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත්වී තිබීම. මින් විෂයයන් 5 ක් එක්වරකදී සමත්වී තිබිය යුතුය.

*සහ*

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(II) *බාහිර අයදුම්කරුවන් සඳහා :*

(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

*සහ*

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(III) *වෘත්තීය සුදුසුකම් :*

(අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම; *හෝ*

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; *හෝ*

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; *හෝ*

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; *හෝ*

(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

2. මෝටර් කාර්මික (මිකැනික්)

තනතුරු - 01

මාසික : රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL2-2006A)

එම

3. ආදාහනාගාර ක්‍රියාකරු III
තනතුරු 04
මාසික : රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL2-2006A)

(I) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

*(අ)* අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම සහ
*(ආ)* තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.)

(II) *බාහිර අයදුම්කරුවන් සඳහා :*

*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයන් දෙකක් සමත්වී තිබීම;

*සහ*

*(ආ)* තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

4. මුරකරු II
තනතුරු 02
මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා.ප.ච. 6/2006 iv හි) (PL-1-2006-A) (වැටුප් පරිමාණයේ 12 වන පියවර රු.13,060) ආරම්භක වැටුප වේ.

(I) *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය.

5. රියදුරු II ආ
තනතුරු 05
මාසික : රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 - (PL-3 -2006-A)

(I) *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 5 ක් සමත්ව තිබිය යුතුය.)

(II) *වෘත්තීය සුදුසුකම් :*

*(අ)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර් 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.

*(ආ)* වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

*(ඇ)* අවම වශයෙන් උස අඩි 05 ක් විය යුතුය.

*(ඈ)* දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
*(ඉ)* මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

6. කාර්යාල කාර්ය සහායක
තනතුරු 04
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (රා. ප. ච. 6/2006 iv හි (PL-1-2006A) වැටුප් පරිමාණයේ 12 වන පියවර රු.13,060 ආරම්භක වැටුප වේ.)

(I) අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය.

7. පුස්තකාල සහායක
තනතුරු 02
මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා.ප.ච. 6/2006 iv හි (PL-1-2006A) වැටුප් පරිමාණයේ 12 වන පියවර රු. 13,060 ආරම්භක වැටුප වේ)

(I) *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයන් 06 ක් සමත් විය යුතුය.

08. වැඩ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග කම්කරු)
තනතුරු 05
මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (රා.ප.ච. 6/2006 iv හි (PL-1-2006-A)

(I) *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* අවම වශයෙන් 5 වන ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය.

09. සෞඛ්‍ය කම්කරු
තනතුරු 02
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600

*(අ)* අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ.

(

02. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iv) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-* රා.ප. චක්‍රලේඛ 24/95 විධිවිධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

04. *අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :–*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුය :–

i. උප්පැන්න සහතිකයේ පිටපත,
ii. අධ්‍යාපන සහතික පිටපත්,
iii. පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම සේවා සහතිකයේ පිටපත,
iv. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත්.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත් දරු/වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලටද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද හා නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

06. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) සකස් කරන ලද අයදුම්පත් 2014.10.31 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
(3) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.
(4) ඉහත සඳහන් කොන්දේසිවලට අනුව නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම නිවේදනය සංශෝධනය කිරීම අවලංගු කිරීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ පූර්ව බලය මහරගම නගර සභාවේ ලේකම් සතුවේ.

ලේකම්,
මහරගම නගර සභාව.

2014 සැප්තැම්බර් මස 25 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මහරගම නගර සභාව

———————— .තනතුර සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම :————————————
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————
03. ස්ථිර ලිපිනය :————————————
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————
05. දුරකථන අංකය :————————————
06. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
07. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— දිනය :——————
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: අවුරුදු :—————— මාස :—————— දින :——————
09. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————
10. විවාහක/අවිවාහක බව :————————————
11. ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින්ද ලියාපදිංචියෙන්ද යන වග :————————————
12. අධ්‍යාපන සුදුසුකම් : (සහතික වල පිටපත් ඇමිණිය යුතුය)

(i) අ.පො.ස. (සා. පෙළ) විභාගය :

සමත් වර්ෂය හා විභාග අංකය :——————

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ii) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය/වසර :——————

13. වෙනත් සුදුසුකම් :————————————

14. සේවා පළපුරුද්ද :

14.1 දැනට සේවය කරන ආයතනය :————————————

14.2 දැනට දරන තනතුර :————————————

14.3 එම තනතුරට පත් වූ දිනය :————————————

14.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

________________,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :____________________
පදවි නාමය හා ආයතනය :____________________

10-478

# පළාත් පාලන නිවේදන

## කටුවන ප්‍රාදේශීය සභාව

විනෝද බදු

**විනෝද බදු ආඥාපනත**

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ 1 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2013 මාර්තු මස 27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සම්මත කරන ලද පහත දැක්වෙන යෝජනාව, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ 2 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් පාලන ප්‍රධාන අමාත්‍යවරයා විසින් 2014.07.07 දිනැති දපස/ප්‍රඅ/පපා/05/8 වි. බදු අංක දරන ලිපිය මගින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*යෝජනාව*

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කටුවන ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළ වූ ප්‍රදේශයෙන් පවත්වන ලද (තත් ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තකට ඇතැම් විට කරන ලද ගෙවීම්වලින් මෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ බද්දක්, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පල කරන ලද දින සිට පනවා අය කළ යුතු යැයි කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *ගෙවූ මුදල* | *බදු ප්‍රමාණය* |
|---|---|
| මුළු ආදායමෙන් | 10% |

අයි. ජී. මහින්ද,
සභාපති,
කටුවන ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 04 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභාවේ දීය.

10-313

## මාතර මහ නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

මාතර මහ නගර සභාවේ සභා සම්මුතියට අනුව, වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී –

මහ නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 23 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වීථියේ වර්තමාන නම | අළුතින් යොදා ඇති නම | මාර්ග විස්තරය |
|---|---|---|---|---|---|
| 01 | මාතර මහ නගර සභාව | මාතර | වල්ගම ශ්‍රී සුනන්ද මාවත තැපැල්වත්ත නමින් භාවිතා කරනු ලබන ප්‍රවේශ මාර්ගය | එකමුතු මාවත | *ආරම්භය :* සුනන්ද මාවත *අවසානය :* වරිපනම් අංක 36/6, ජේ. විමලසූරිය යන අයගේ නිවස. |

10-462

---

**වඩමාරච්චි දකුණ/බටහිර ප්‍රාදේශීය සභාව - කරවෙඩ්ඩි**

1975 අංක 17 දරන පනතේ කම්ටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය

පහත ශීර්ෂයේ සඳහන්කර ඇති පුද්ගලයින්ගේ ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කම්ටුව 2015 වර්ෂයේ පවත්වාගෙන යාමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වැනි වගන්තිය අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

මෙම අයිතිය ලබාදීමට යෝජනාකර ඇති කම්ටුව පවත්වාගෙන යාමට තීරණයකර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළ කරයි නම් ගැසට් නිවේදනය පළ කර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කම්ටුවේ සභාපති ද, ලේකම් ද, කළමනාකරු ද, යන වග* | *කම්ටුවේ නම* | *කම්ටුව පවත්වාගෙන යාමට සුදුසු යයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| අය්යාතුරෙයි විග්නේෂ්වරන් අයිංකරාපදි තෙ වරයාලි නෙල්ලිඅඩි | කළමනාකරු | අයිංගරන් විනෝදාංශ සමාජය | ප්‍රධාන වීදිය, නෙල්ලිඅඩි, කරවෙඩ්ඩි |

ක. කනකදුරෙයි,
ලේකම්.

2014 සැප්තැම්බර් මස 22 වැනි දින,
වඩමාරච්චි දකුණ බටහිර,
ප්‍රාදේශීය සභාව,
කරවෙඩ්ඩි.

10-464

---

# අතුරු ව්‍යවස්ථා

**බදුල්ල ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත

*ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2වැනි වගන්තිය යටතේ, ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ, වර්ෂ 2012 ඔක්තෝබර් මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* අංක 1778/45 යටතේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වලින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2014 ජනවාරි මස 28 දින පැවති ගරු මහ සභාවේදී යෝජනා කොට සම්මත වූ බව මෙයින් දන්වමි.

ආර්. එම්. යූ. එන්. සරත් කුමාර,
සභාපති,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

වර්ෂ 2014 ජූලි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

10-384/1

### බදුල්ල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත

*ප්‍රජා මූල සංවිධාන විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අතුරු ව්‍යවස්ථාව*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු (262 අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදන ලද, වර්ෂ 2013 ජනවාරි 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* අංක 1794/12 යටතේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමඟ කියවිය යුතු 122 වන වගන්තියෙන් බලය ලබා දී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ සඳහන් විධිවිධාන වලට යටත්ව *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට පිළිගෙන වැළඳගෙන ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2013 ජූලි මස 29 දින පැවති ගරු මහා සභාවේ දී යෝජනා කොට සම්මත වූ බව මෙයින් දන්වමි.

ආර්. එම්. යූ. එන්. සරත් කුමාර,
සභාපති,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

වර්ෂ 2014 ජූලි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

10-384/2

---

### බදුල්ල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ වර්ෂ 2010 ක් වූ නොවැම්බර් මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* අංක 1678/4 යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (ix) වැනි උප වගන්තියේ (ච) ඡේදයෙන් මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාරව මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළවන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2014 ජනවාරි මස 28 දින පැවති ගරු මහා සභාවේ දී යෝජනා කොට සම්මත වූ බව මෙයින් දන්වමි.

ආර්. එම්. යූ. එන්. සරත් කුමාර,
සභාපති,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

වර්ෂ 2014 ජූලි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

10-384/3

---

### බදුල්ල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත යටතේ සියළුම සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපනයට අදාළ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු (262 වන අධිකාරය වූ) 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ සාදන ලදුව වර්ෂ 2013 ජූනි 28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* අංක 1816/43 යටතේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමඟ කියවිය යුතු 126 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තියේ 3 වන උප වගන්තියෙහි විධිවිධාන වලට යටත්ව පිළිගෙන වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට ක්‍රියාත්මක කිරීමට වර්ෂ 2013 සැප්තැම්බර් මස 27 දින පැවති ගරු මහා සභාවේ දී යෝජනා කොට සම්මත වූ බව මෙයින් දන්වමි.

ආර්. එම්. යූ. එන්. සරත් කුමාර,
සභාපති,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

වර්ෂ 2014 ජූලි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

10-384/4

# විවිධ දැන්වීම්

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ තිහගොඩ ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිදි ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියෙන් දක්වා ඇති අනු ප්‍රමාණයන්ගෙන් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛන අංක 01**

***1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු :***

| | *වෙළඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොවනවිට රු.* | *වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු.* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු.* |
|---|---|---|---|---|
| 01. | බේකරියක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ කෝපි කඩයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ලැගුම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | බාබර් සාප්පුවක් පැවැත්වීම | 350 0 | 750 0 | 1,000 0 |
| 06. | මස් වෙළෙඳ සැල් | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ලොන්ඩරි | 350 0 | 550 0 | 750 0 |
| 08. | සිසිල් බීම කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ගව ගාල | 300 0 | 450 0 | 600 0 |
| 11. | මාළු | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | හොටෙල් | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | සංචාරක මණ්ඩලයේ අනුමත හොටෙල්, ආපන ශාලා, ලැගුම්හල් හා රෙස්ටුරන්ට් | පෙර වර්ෂයේ ආදායමෙන් 1%ක් බලපත්‍ර ගාස්තු ලෙස ගෙවිය යුතු ය. | | |
| | *අන්තරාදායක හා අප්‍රසන්න කර්මාන්ත :* | | | |
| 01. | ගල්වලක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කම්හලක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 1,000 0 |
| 03. | කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | වාහන සේවා (සර්විස්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | පෑස්සුම් (වෙල්ඩින්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 350 0 | 750 0 | 1,000 0 |
| 06. | විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ට්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | එළවළු, පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ශීත කළ මස් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**තිහගොඩ ප්‍රාදේශීය සභාව - තිහගොඩ**

2015 වර්ෂය සඳහා කර්මාන්ත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛන වලින් දක්වා ඇති පරිදි ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බද්දක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියෙන් දක්වා ඇති බදු අනු ප්‍රමාණයෙන් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,<br>සභාපති,<br>තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,<br>තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මෙම කර්මාන්ත බදු 2015 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

**උපලේඛන අංක 01**

***1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු***

| | *වෙළඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්ම නොවනවිට රු.* | *වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු.* | *වාර්ෂික වටිනාකම රු. 1501 ට වැඩි රු.* |
|---|---|---|---|---|
| 01. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| 02. | ඇළුමිනියම්, ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ කුඩු කුළුබඩු පැකට් කර විකිණීම | 300 0 | 350 0 | 500 0 |
| 04. | පා පැදි අලුත් වැඩියා කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 05. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | යතුරු පැදි, ත්‍රීවිල් අළුත් වැඩියා කිරීම | 350 0 | 750 0 | 1,000 0 |
| 07. | සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ටයර් ටියුබ් අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පොල් තෙල් මෝලක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| 11. | ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 1,000 0 |
| 17. | බීරළු ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හුණු පිළිස්සීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 750 0 |
| 19. | කොප්පරා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 |
| 20. | ගිනිකෙළි භාණ්ඩ නිපදවීම/විකිණීම | 300 0 | 600 0 | 1,000 0 |
| 21. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 1,000 0 |
| 22. | වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම | 300 0 | 450 0 | 600 0 |
| 24. | මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | රන්, රිදී ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 |
| 26. | මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ගල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30 | කිරි ශීත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10 - 460/2

### තිහගොඩ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ තිහගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත I වැනි උප ලේඛනයේ පරිදි වාර්ෂික බද්දක් II වැනි උප ලේඛනයේ සඳහන් ව්‍යාපාර සම්බන්ධයෙන් පසු ගිය වර්ෂයේ ආදායම් පදනම් කරගෙන 2015 වර්ෂයේ අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

* මෙම ව්‍යාපාර බදු 2015 ජුනි 30 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

#### I වැනි උපලේඛනය

| | *ව්‍යාපාරයේ ආදායම* | *ගෙවිය යුතු බද්ද (රු.)* |
|---|---|---|
| 01. | රු. 6,001 සිට 12,000 දක්වා | 90 0 |
| 02. | රු. 12,001 සිට 18,750 දක්වා | 180 0 |
| 03. | රු. 18,751 සිට 75,000 දක්වා | 360 0 |
| 04. | රු. 75,001 සිට 1,00,000 දක්වා | 600 0 |
| 05. | රු. 1,00,001 සිට 1,25,000 දක්වා | 1,200 0 |
| 06. | රු. 1,25,001 සිට 1,50,000 දක්වා | 2,000 0 |
| 07. | රු. 1,50,000 ට වැඩි | 3,000 0 |

#### II වැනි උපලේඛනය

01. රෙදිපිළි නිමි ඇඳුම් අලෙවි සැලක් පවත්වාගෙන යාම
02. සාප්පු බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම
03. පාවහන් අලෙවි සැලක් පවත්වාගෙන යාම
04. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
05. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
06. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
07. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
08. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
09. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. තීන්ත අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. යකඩ බඩු (හාඩ්වෙයාර්) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
14. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
15. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
16. පරිගණක පුහුණු පාඨමාලා ආයතනයක් පවත්වාගෙන යාම
17. ජ්‍යොතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
18. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
19. පැළ තවානක් (නර්සරි) පවත්වාගෙන යාම
20. ආයුර්වේද බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
21. ඉංග්‍රීසි බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් (ෆාමසියක්) පවත්වාගෙන යාම
22. දුරකථන සේවා සපයන සමාගමක් පවත්වාගෙන යාම
23. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
25. සත්ව සායනයක් පවත්වාගෙන යාම
26. නීතිඥ, නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
27. විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
28. බැංකුවක් පවත්වාගෙන යාම
29. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
30. ලීසිං සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
31. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
32. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
33. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
34. ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
35. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
36. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
37. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම
38. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. පරිගණක හා උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
42. උත්සව භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
43. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
44. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. රේස් බුකියක් පවත්වාගෙන යාම
47. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
48. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
50. දුරකථන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
51. ජංගම දුරකථන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
52. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
53. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම
54. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
55. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
56. ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම
57. සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
58. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ගබඩාවක් ලෙස කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
60. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
63. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. යතුරු පැදි/ත්‍රිරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. පා පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

68. යතුරු පැදි, ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
70. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
72. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
73. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
74. මැණික් මිලදී ගන්නා ස්ථාන හා මැණික් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
76. සුපිරි වෙළඳ සැලක් (ෆුඩ්සිටි) පවත්වාගෙන යාම
77. දුරකථන පෙර ගෙවුම් කාඩ් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
78. තේ කම්හලක් පවත්වාගෙන යාම
79. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
80. සුරතල් මසුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
81. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. ශීතකළ මාළු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. යෝගට් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. පොහොර වෙළඳසැලක් පවත්වාගෙන යාම
86. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
87. අයිස්ක්‍රීම් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම
91. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. මුද්‍රණාලයක් පැවැත්වීම
94. ගෑස් ගබඩා කිරීම හා විකිණීම

10 - 460/3

---

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

### විනෝද බදු - 2015

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ ප්‍රකාර චිත්‍රපට දර්ශනයක් මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත දර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් තිහගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන්නේය. මීට අමතරව ඉහත සංදර්ශන වෙනුවෙන් පහත සඳහන් අයුරු බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | රු. |
|---|---|---|
| (i) | මුදල් අයකරන සංගීත ප්‍රසංගයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,000 |
| (ii) | මුදල් අය නොකරන සංගීත ප්‍රසංගයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 500 |
| (iii) | මුදල් අයකරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 1,000 |
| (iv) | නාට්‍ය සංදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව | 500 |

වැඩිවන සෑම දිනයක් සඳහාම රු. 50 00 බැගින් අය කෙරේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10 - 460/4

---

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

### සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම - 2015

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 දරන වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි තිහගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැලසෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා එම ඉඩම සංවර්ධනය කළ හැකි අවස්ථාවක සහ,

*(අ)* එම ඉඩමේ කිසිදු ගොඩනැගිල්ක් ඉදිකර නොමැති වූ; හෝ

*(ආ)* සැබැවින් ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඉඩමේ බිම් ප්‍රමාණය ඒ ඉඩමේ මුළු ප්‍රමාණයට නියමිත සමානුපාතයකට වඩා අඩු සමානුපාතයකින් ප්‍රාදේශීය සභා යෝජිත සම්මතයක් මගින් දරන්නා වූ; හෝ

*(ඇ)* ඒ ඉඩමේ විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ අවස්ථාවකදී ;

ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන හිමි අගයෙන් සියයට එකක් (1%) බද්දක් සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බද්දක් වශයෙන් ඉඩමේ අයිතිකරුවන්ගෙන් වාර්ෂිකව අය කිරීමට සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-460/9

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (ආ) හා 122 - 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශේෂ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව 2012.08.10 වැනි දින අංක 1771 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 39 යටතේ තිහගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදි කිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු පනවා අයකිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| | *ප්‍රචාරක දැන්වීම් විස්තරය* | *අවසර පත්‍රය සඳහා ගාස්තුව රු. ශ.* |
|---|---|---|
| 01. | පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමකට සෑම වර්ග අඩියකටම වර්ෂයකට | 75 00 |
| 02. | පුද්ගලයකු විසින් ගෙන යනු ලබන හෝ ගමන් කරනු ලබන වාහනයක සවිකොට ඇති පුවරුවක හෝ ආධාරකයක් මගින් ප්‍රචාරය කරනු ලබන දැන්වීමකට මසකට (රෙදි බැනර් ආදිය) | |
| | *(අ)* වර්ග අඩි 6 කට වැඩි නොවන සෑම වර්ග අඩියකටම | 10 0 |
| | *(ආ)* වර්ග අඩි 6කට වැඩි සෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකටම | 25 0 |
| 03. | කිසියම් පෞද්ගලික හෝ පොදු නිවසක හෝ ගොඩනැගිල්ලක, බිත්තියක, වහලක, හෝ තාප්පයක මහජනයාට පෙනෙන පරිදි කිසියම් වෙළෙඳ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය වීමට සැලැස්වීම සඳහා වර්ග අඩියකටම | 10 0 |
| 04. | ප්‍රතිදීප්ත ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකටම | 100 0 |

10 - 460/5

---

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

කසල ශෝධන ගාස්තු අය කිරීම - 2015

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126 (ix) ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් කසල ශෝධන සේවාව සලසනු ලබන යටියන උපනගරය, තිහගොඩ උපනගරය, තිහගොඩ බටහිර. මැදඋයන්ගොඩ සහ කපුදූව පහේ කණුව ඇතුළු කසල එකතු කිරීමේ විශේෂ ව්‍යාපෘතියට ඇතුළත්වන, මාර්ගවල පදිංචි වරිපනම් අය නොකරන නිවෙස්වලින් රු. 75ක කසල ගාස්තුවක් ද, ව්‍යාපාරික ස්ථාන වලින් රු. 150ක කසල ගාස්තුවක් මසකට වරක් අය කිරීමට සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-460/7

## තිහගොඩ ප්‍රාදේශීය සභාව

අක්කර බදු අය කිරීම - 2015

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 (3) වැනි වගන්තිය ප්‍රකාර තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූද (ගොඩ ඉඩම්) හෙක්ටයාර් 01 ක් හෝ ඊට වැඩි ඉඩම්වලින් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුතු අක්කර බද්දක් 2015 වර්ෂයට පනවා 2015 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දායින් අවසන් වන අයුරු කාර්තු 04න් අයකර ගැනීමටත් මෙම පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් 2015 ජනවාරි 31 වැනි දිනට පෙර සම්පූර්ණයෙන් ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක වට්ටමක් හා බදු මුදල කාර්තු වශයෙන් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවන්නේ නම් කාර්තුවේ සඳහන් මුදලින් 5%ක වට්ටමක් ලබාදිය යුතු බව සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 07.1 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශත |
|---|---|
| හෙක්ටයාර් 01 කට නොඅඩු හෙක්ටයාර් 05 අඩු | 50 0 |
| හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි සෑම හෙක්ටයාර් එකකටම | 10.0 |

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10 - 460/6

**තිහගොඩ ප්‍රාදේශීය සභාව**

ගොඩනැගිලි ඉදිකිරීම හා වෙනත් ගාස්තු අය කිරීම - 2015

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| | |
|---|---|
| 01. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව | *රු. ශත* |
| (i) නාගරික බල ප්‍රදේශයෙන් බැහැර | 500.00 |
| (ii) නාගරික බල ප්‍රදේශය තුළ | 750.00 |
| 02. නොපවරා ගැනීමේ සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම | 500.00 |
| 03. අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව (එක් ගසක් සඳහා) - | |
| (i) කොස් ගසක් සඳහා | 750.00 |
| (ii) වෙනත් ගසක් සඳහා | 500.00 |
| 04. ගොඩනැගිලි අනුකූලතා සහතිකපත්‍ර සඳහා ගාස්තුව | 3,500.00 |
| 05. වෙනත් සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් නිකුත් කිරීමේ ගාස්තුව | 250.00 |
| 06. කර්මාන්ත ගිවිසුම් පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව (පිටපත් - 04 සඳහා) | 600.00 |
| 07. ටෙන්ඩර් අයදුම්පත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව - | |
| (i) රු. 10,000.00ට අඩු ටෙන්ඩර් සඳහා | 250.00 |
| (ii) රු. 10,000.00ට වැඩි ටෙන්ඩර් සඳහා | 500.00 |
| 08. තාවකාලික වෙළඳකුටි ඉදිකිරීමේදී එක් දිනකට වර්ග අඩියකට | 10.00 |
| 09. අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සඳහා සභාව සතු භූමියේ නිශ්චිත ස්ථානයක් ලබාදීම (එක් දිනක් සඳහා) | 1000.00 |

10. සංවර්ධන අවසර පත්‍ර ලබාගැනීම සඳහා අවම පෙරසැරි ගාස්තු ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු පහත සඳහන් පරිදි අය කරනු ලැබේ.

**උපලේඛනය**

| *සංවර්ධන කාර්යයේ ස්වභාවය* | *භාවිතා කළයුතු ආකෘති පත්‍රය* | *අය කළ යුතු ගාස්තුව* | |
|---|---|---|---|
| (i) ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | "අ" | (i) පෙරසැරි ගාස්තු බිම් කට්ටියක ප්‍රමාණය | එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර) රු. |
| | | *ව.මී. 150 - 300 අතර | 500 |
| | | *ව.මී. 301 - 600 අතර | 400 |
| | | *ව.මී. 601 - 900 අතර | 300 |
| | | *ව.මී. 901ට වැඩි | 200 |

| *සංවර්ධන කාර්යයේ ස්වභාවය* | *භාවිතා කළයුතු ආකෘති පත්‍රය* | *අය කළ යුතු ගාස්තුව* | | |
|---|---|---|---|---|
| | | (ii) ආවරණ අනුමැතිය සඳහා ගාස්තු එක් බිම් කොටසකට රු. 750 බැගින් | | |
| ගොඩනැගිලි ඉදි කිරීම/කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | "ආ" | (i) පෙරසැරි ගාස්තු ගෙබිම් විශාලත්වය | පදිංචිය සඳහා රු. | වාණිජ හෝ වෙනත් භාවිතා රු. |
| | | 45ට අඩු | 500 | 1,000 |
| | | 45 - 90 | 1,500 | 2,000 |
| | | 91 - 180 | 2,500 | 3,000 |
| | | 181 - 270 | 3,500 | 4,000 |
| | | 271 - 450 | 4,500 | 6,000 |
| | | 451 - 675 | 5,500 | 8,000 |
| | | 676 - 900 | 6,500 | 10,000 |
| | | 901 - 1225 | 7,500 | 12,000 |
| | | 1225ට වැඩි | 7,500 | 12,000 |
| | | | ව.මී. 90ක් වන එක් එක් අමතර ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 1,000 බැගින් | ව.මී. 90ක් වන එක් එක් ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 1,250 බැගින් |

| | රු. ශත |
|---|---|
| 11. අනු බෙදුම් අයදුම් පත්‍ර ගාස්තුව | 250.0 |
| 12. පුස්තකාල සාමාජික ඇප තැන්පත් | 100 0 |
| 13. පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු | 10 0 |
| 14. සභාව සතු ප්‍රජාශාලා පෞද්ගලික පෙර පාසැල් සඳහා බදු දීම එක් ළමයෙකුගෙන් මසක් සඳහා | 10 0 |
| 15. සභාව සතු ක්‍රීඩා භූමි පරිහරණය කිරීම වෙනුවෙන් එක් දිනක් සඳහා | 1,000 0 |
| 16. සභාව සතු සුසාන භූමිය - එක් මරණයක් මිහිදන් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම | 500 0 |

10 - 460/10

---

**තිහගොඩ ප්‍රාදේශීය සභාව**

දුරකථන කුළුණු සඳහා ගාස්තු අය කිරීම - 2015

2015 වර්ෂය සඳහා තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකරනු ලබන සෑම දුරකථන සංඥා කුළුණක් සඳහාම අළුතින් බලපත්‍රයක් ලබා ගැනීමේදී රු. 50,000 ක පෙරසැරි ගාස්තුවක් ද වාර්ෂික බලපත්‍ර ගාස්තුව සෑම කුළුණකම ඇති සෑම සමාගමක් සඳහාම රු. 3,000ක ගැස්තුවක් පනවා අය කිරීම සුදුසු යැයි තිහගොඩ ප්‍රාදේශීය සභාවේ 2014.08.27 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 07.1 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිර්මාල් සමරසිංහ,
සභාපති,
තිහගොඩ ප්‍රාදේශීය සභාව.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-460/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.